ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,935 - 2015 ඔක්තෝබර් මස 02 වැනි සිකුරාදා - 2015.10.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව
තනතුරු-ඇබෑර්තු	1362
විභාග, විභාග ප්‍රතිඵල ආදිය	—
පළාත් පාලන නිවේදන	1365
අතුරු ව්‍යවස්ථා	—
පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ...	—
ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන	—
අයවැය ලේඛන	—
දේපළ විකිණීම්	—
විවිධ දැන්වීම්	1368

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ඔක්තෝබර් මස 23 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ඔක්තෝබර් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

තනතුරු ඇබෑර්තු

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනු. අංකය	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*වැටුප් ක්‍රමය*	*අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්*
(1)	කාර්යාල කාර්ය සහයක	01	PL1 -2006 A රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600	අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්ව සිටිය යුතුයි.

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.
(ii) අයදුම්කරු දකුණු පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
(iii) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බල නොපානු ඇත.)
(iv) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතු ය.
(v) කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ අදාළ තනතුරේ ආදේශක/අනියම්/කොන්ත්‍රාත් තනතුරුවල සේවය කරන අය කෙරෙහි වැඩි අවධානය යොමු කරනු ලැබේ.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
(vii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවනු ලබන කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙන් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා ලේකම් සතු ය.

03. *සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය:-

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය ;
(v) මෑතක දී ලබා ගත් චරිත සහතික 02ක් ;
(vi) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(vii) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;

04. *අයදුම් කළ යුතු ආකාරය :*

(i) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (A4 ප්‍රමාණයේ) අයදුම්පත් 2015.10.31 වැනි දිනට පෙර "ලේකම්, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව, කිරින්ද" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(ii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය.
(iii) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතු ය.
(iv) අතින් ගෙනැවිත් භාරදෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩී. කේ. දයාසීලි,
ලේකම්,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2015 සැප්තැම්බර් මස 15 වැනි දින,
කිරින්ද,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ .... තනතුර සඳහා බඳවා ගැනීම

(1) (අ) මුලකුරු සමග නම :————————————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————.

(2) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.

(3) ස්ථිර ලිපිනය:————————————.

(4) (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද?:————————————.

(ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන්ද ?:————————————.

(5) ජාතික හැඳුනුම්පත් අංකය :————————————.

(6) ස්ත්‍රී/පුරුෂ භාවය:————————————.

(7) විවාහක/අවිවාහක තත්ත්වය:————————————.

(8) දුරකථන අංකය:————————————.

(9) උපන් දිනය

වර්ෂය:————————————. මාසය:————————————. දිනය:————————————.

(10) 2015.10.31 වැනි දිනට වයස :

අවුරුදු :————————————. මාස:————————————. දින:————————————.

(11) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :————————————.

(12) වෘත්තීය සුදුසුකම් :————————————.

(13) සේවා පළපුරුද්ද:————————————.

(14) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? :————————————.

(15) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :————————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් මා පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————————.

දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්කරු වන .... මයා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. /නොකරමි.

————————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:————————————.
පදවි නාමය:————————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:————————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය:————————————.

10-274

අම්බලන්තොට ප්‍රාදේශීය සභාව

අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත කණිෂ්ඨ සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණියන්හි පහත සඳහන් තනතුරු සඳහා සුදුස්සන් තෝරාපත් කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අනු. අංකය	*තනතුරු නාමය*	*තනතුරු සංඛ්‍යාව*	*වැටුප් පරිමාණය*	*අධ්‍යාපන සුදුසුකම්*
01	සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය	02	රා.ප.චක්‍ර. 06/2006(iv) PL-1 -2006 A අනුව මාසික රු.11,730-10x120-10x130-10x145-12x160-රු.17,600	8 වන ශ්‍රේණිය (9 වසර) සමත්ව සිටීම.

සේවයේ නියුක්ත කිරීම පිළිබඳ කොන්දේසි :

1. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත් වන්නේය.
3. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, දකුණු පළාත් සභාව විසින් හා අම්බලන්තොට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට ඔබ බැඳී සිටිය යුතුය.

බඳවා ගැනීමේ කොන්දේසි :-

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුයි.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වර්ෂ 05ක අනුගාමී වසර 03ක අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය සහතික කළ යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. එහෙත් දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ.
5. අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රවීණතා මඟින් සුදුසු අය තෝරා ගැනේ.
6. දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ. දැනටමත් ආදේශක සේවයේ නියුතුව සිටීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-

අයදුම්පත්‍ර පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2015.10.16 දිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, අම්බලන්තොට යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල ඡායාපිටපත් එවිය යුතු ය.

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය(ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිත) ;
4. මෑතක දී ලබා ගත් චරිත සහතික 02ක් ;
5. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය ;
6. තනතුරට අදල නිපුණතා සහතිකයේ පිටපතක් ;

අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන අතර, මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

පී. නම්බුකාර ගමගේ,
ලේකම්,
අම්බලන්තොට ප්‍රාදේශීය සභාව.

2015 සැප්තැම්බර් මස 15 වැනි දින,

සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය

(1) අයදුම්කරුගේ මුලකුරු සමග නම :————————————.

(2) මුලකුරුවලින් හැඳින්වෙන නම :————————————.

(3) ස්ථිර පදිංචි ලිපිනය:————————————.

(4) ස්ත්‍රී/පුරුෂ භාවය :————————————.

(5) විවාහක/අවිවාහක බව :————————————.

(6) (i) උපන් දිනය :————————————.

(ii) 2015.10.16 වැනි දිනට වයස ඃ අවුරුදු:——————————. මාස:——————————. දින:——————————.

(7) ජාතික හැඳුනුම්පත් අංකය :————————————.

(8) ජාතිය :————————————.

(9) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන්ද යන වග :————————————.

(10) අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය:————————————.

(11) අධ්‍යාපන සුදුසුකම් :————————————.

(12) සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර :————————————.

(13) වෙනත් සුදුසුකම්:————————————.

(14) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී තිබේ ද? :————————————.

තිබේ නම් ඒ පිළිබඳ විස්තර :————————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරු වලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත්, පත් කිරීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දනිමි. මම කිසිදු උසාවියකින් සාපරාදී වරදකට වරදකරු වී නොමැති බවද, මාගේ සුපුරුදු අත්සන තබා සහතික කරමි.

————————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————————.

10-123

පළාත් පාලන නිවේදන

කටුවන ප්‍රාදේශීය සභාව

261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභාව විසින් 2015 ජූලි මස 17 දින පවත්වන ලද මුදල් කමිටු රැස්වීමේදී පහත උපලේඛනයේ සඳහන් තීරණ අංක 09 දරන යෝජනාව සම්මත කරන ලද බව මහජනයා වෙත නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. එම්. පුෂ්පකුමාර,
ලේකම්,
කටුවන ප්‍රාදේශීය සභාව.

2015 ජූලි මස 20 වැනි දින,
කටුවන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වන අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.05.17 දින අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ ද, දකුණු පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලද බව 2014.08.29 දින අංක

1878 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්ද වූ ද, සම්මත අතුරු ව්‍යවස්ථාවල අංක XXVII වැනි කොටස - ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව හැර අනෙක් සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළකරනු ලබන දින සිට පිළිගෙන ක්‍රියාත්මක කිරීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරයි.

i වැනි කොටස	-	සියලු සම්මත අතුරු ව්‍යවස්ථාවලට අදළ අර්ථ නිරූපණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා
ii වැනි කොටස	-	සියලුම අතුරු ව්‍යවස්ථාවලට අදාළ පොදු විධිවිධාන පිළිබඳ අතුරු ව්‍යවස්ථා
iii වැනි කොටස	-	කිසියම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන හෝ නියමයන් උල්ලංඝනය කිරීම සම්බන්ධ දඬුවම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
iv වැනි කොටස	-	මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
v වැනි කොටස	-	මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
vi වැනි කොටස	-	සිසිල්බීම කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
vii වැනි කොටස	-	කොණ්ඩා සැකසීමේ ස්ථාන, බාබර් සාප්පු හා සැලුන්හල් සහ රූපලාවන්‍ය මධ්‍යස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
viii වැනි කොටස	-	බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
ix වැනි කොටස	-	කිරි පට්ටි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
x වැනි කොටස	-	පිහිනුම් තටාක පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xi වැනි කොටස	-	අයිස් කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xii වැනි කොටස	-	බත් කඩ, ආපනශාලා, තේ කෝපි කඩ පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xiii වැනි කොටස	-	හෝටල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xiv වැනි කොටස	-	නවාතැන් පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xv වැනි කොටස	-	ලොන්ඩරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xvi වැනි කොටස	-	කර්මාන්ත ශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xvii වැනි කොටස	-	අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xviii වැනි කොටස	-	සංචාරක වෙළඳුන් විසින් ආහාරපාන ද්‍රව්‍ය වෙළඳාම් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xix වැනි කොටස	-	පදික මාරු ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xx වැනි කොටස	-	ඉදිකිරීම් ද්‍රව්‍ය ආශ්‍රිත කර්මාන්ත ස්ථාන හා ඉදිකිරීම් ද්‍රව්‍ය ගබඩා ස්ථාන විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xxi වැනි කොටස	-	වාහන නතර කිරීම හා හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xxii වැනි කොටස	-	මාර්ගවලට අලාභ හානි කිරීම සහ මාර්ගවල ගමනාගමනයට බාධාකිරීම, වැළැක්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xxiii වැනි කොටස	-	ආදහනාගාර විධිමත් කිරීම, පාලනය කිරීම හා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xxiv වැනි කොටස	-	පොදු වෙළඳපොල පවත්වාගෙන යාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xxv වැනි කොටස	-	ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xxvi වැනි කොටස	-	ප්‍රජාශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xxviii වැනි කොටස	-	උකස් හා උකස් හිමියන් ලියාපදිංචි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
xxix වැනි කොටස	-	වාර වාර්තා සහ තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

10-288

වරකාපොල ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා විනෝද බදු පැනවීම

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ වරකාපොල ප්‍රාදේශීය සභාව විසින් 2015.07.28 දින පවත්වන ලද සභා රැස්වීමේදී තීරණ අංක 06-02-06 පහත දැක්වෙන යෝජනාව 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ (2) වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු විනෝද බදු ආඥාපනතේ (2) වන වගන්තියේ (2) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර සබරගමුව පළාතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

බී. ඒ. සී. කීර්තිසිරි විජේතුංග,
සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

2015ක් වූ ජූලි මස 28 වැනි දින,
වරකාපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥා පනතේ දෙවන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වරකාපොල ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව ඇතුලත වූ ප්‍රදේශයෙන් පවත්වන ලද (තත් ආඥා පනතේ විස්තර කර ඇති) විනෝද කටයුත්තක් සඳහා කරන ලද ගෙවීම් වලින් 25%ක බද්දක් ද සිනමා ශාලා මගින් නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර සඳහා 7.5% ක මුදලක් ද මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට පනවා අය කළ යුතු යැයි වරකාපොල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

10-286

උඩුනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(01) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ, මහනුවර දස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදළ ඉඩම් වල හිමිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් හෝ යම් විරෝධතාවයක් පළකරන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මාසයක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(11) වැනි වගන්ති ප්‍රකාරව ක්‍රියාකරන ලෙස මින් දැනුම් දෙනු ලැබේ. එසේ එවන ලිපි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

මෙම කාලසීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරෝධතාවයක් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් උඩුනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

අයි. එම්. එස්. කේ. මහින්ද ඉදිසූරිය,
ලේකම්/බලයලත් නිලධාරි.

උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

උපලේඛනය

අනු. අංකය	මාර්ගයේ නම	ආරම්භය	අවසානය	වම්පස පදිංචිකරුවන්	දකුණු පස පදිංචිකරුවන්	දිග (අඩි)	පළල (අඩි)
01	යාලේගොඩ නැගෙනහිර සිට දුනුකේපොත කුඹුර හරහා මැදගොඩ වත්තට යන පාර	මැදගොඩවත්ත පොදු ළිඳ	යාලේගොඩ නැගෙනහිර මැද්දගෙයා වත්ත පාර	වයි. බී. පොඩිනිලමේ	නිහාල් පානබොක්කේ	300	10
02	යක්අංගේවත්ත පාර	ලිහිනියාගොඩ පන්සල අසල සිට රංගම පාසල දෙසට දිවෙන පාර	පෙරහන්ගේ වත්ත	ජී. බී. කරුණාතිලක		432	07
03	පිල්ලෑව මාර්ගය		එම්. ජී. ප්‍රේමති - ලක මහතාට අයත් හකුරු කුඹුරේ ඉඩම	ඩී. ජී. ජේ. එස්. එල්. ප්‍රේමවර්ධන එච්. ජී. ආර්. පී. විජේසිංහ එච්. ජී. ඒ. ඩී. සමරසිංහ ඩී. ජී. බබානිස් ආර්. එම්. ඩී. බී. දෙනියගොඩ	පූජ්‍ය ඌරාපොල රතනජෝති හිමි එස්. ජී. එස්. සෝමසිංහ නිමන්ති හේන්දෙණිය පූජ්‍ය රත්යායේ ධම්මින්ද හිමි එම්. රංජිත් උපාලි		10
04	වලව්වේවත්ත බමුණුකුඹුරවත්ත පාර	වරකාගොඩ පමුණුව මාර්ගය	ඉඩමේ කෙළවර	එස්. පී. ජී. සීතා ඩී. පී. ජී. මංගලිකා පී. එස්. අශෝක මාරසිංහ ඒ. ඒ. පී. ප්‍රේමකාන්ති ඩබ්. ජේ. පරාක්‍රම කුමාර	ඩී. ජී. ආනන්ද සෙනවිරත්න එස්. ආර්. එස්. රාජපක්ෂ පී. ඉන්ද්‍රානි මාරසිංහ ආර්. පී. ජී. ජී. රාජපක්ෂ තමිර බණ්ඩාර සඳරුවන්	300	10

10-215

විවිධ දැන්වීම්

මුලටියන ප්‍රාදේශීය සභාව

2016 වර්ෂය සඳහා වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 හා 150 වගන්තිවලින් සහ මුලටියන ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා වැළඳගෙන ඇති 2013 මැයි මස 17 දිනැති අංක 1811 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(අ) පළාත් සභා කොටසේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව මගින් මෙම සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් බදු හා බලපත්‍ර ගාස්තු 2016 වර්ෂය සඳහා පනවා අයකිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.09.04 දින අංක 932 දරන තීරණය අනුව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලබන අතර එකී වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා අදල බලපත්‍ර ගාස්තු 2016 මාර්තු මස 31 වන දිනට පෙර මෙම සභාවට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

සී. ඒ. එන්. ජයවර්ධන,
ලේකම්,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2015 සැප්තැම්බර් මස 04 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

I උපලේඛනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ බලපත්‍ර ගාස්තු

	ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන රු. ශ.*	*රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ.*	*රු. 1,500 ට වැඩි රු. ශ.*
1.	ලැගුම් නිවාසයක් හෝ නවාතැන්පොලක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
2.	හෝටලයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
3.	තේ/කෝපි කඩයක් පවත්වාගෙන යාම	350 0	400 0	450 0
4.	බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0
5.	ආපනශාලා (රෙස්ටුරන්ට්ස්) පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
6.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0
7.	කිරි පට්ටියක් පැවැත්වීම			
	(i) දෙනුන් 5-10	400 0	450 0	500 0
	(ii) දෙනුන් 10-25	500 0	550 0	600 0
8.	කිරි වෙළෙඳාමක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
9.	තිරිඟු පිටිවලින් සෑදූ කෑම වර්ග වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0
10.	එළවළු හෝ පළතුරු වෙළෙඳාමක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0
11.	රසකැවිලි නිපදවන ස්ථානයක් පැවැත්වීම	450 0	500 0	550 0
12.	සරුවත් පැණි බීම වෙළෙඳාමක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0
13.	මාළු විකිණීමේ ස්ථානයක් පැවැත්වීම	500 0	600 0	700 0
14.	ශීතකළ මස් හෝ මාළු නිපදවන ස්ථානයක් පැවැත්වීම	450 0	500 0	550 0
15.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
16.	ගව ගාලක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0
17.	පොළක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
18.	අයිස්ක්‍රීම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
19.	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
20.	කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හෝ බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0

II උපලේඛනය

අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම

	ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන රු. ශ.*	*රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ.*	*රු. 1,500 ට වැඩි රු. ශ.*
1.	කළුගල් වලක් හෝ යාන්ත්‍රික කළුගල් මෝලක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
2.	කළුගල් කඩා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	950 0
3.	වී මෝලක් පවත්වාගෙන යාම	600 0	700 0	950 0
4.	පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	800 0	950 0
5.	කම්මලක් පවත්වාගෙන යාම	550 0	600 0	650 0
6.	පොල්තෙල් මෝලක්/පොල්තෙල් ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0
7.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම (ඩිජිටල්)	700 0	950 0	1,000 0
8.	අතින් ක්‍රියාකරන මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0
9.	දැව ගබඩාකරන ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	800 0
10.	යාන්ත්‍රික නොවන ලී ඉරුම්හලක් පවත්වාගෙන යාම	400 0	450 0	550 0
11.	යාන්ත්‍රික ලී ඉරුම් හලක් පවත්වාගෙන යාම	800 0	950 0	1,000 0
12.	මෝටර් රථ ගරාජයක් පවත්වාගෙන යාම	600 0	700 0	900 0
13.	මෝටර් රථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	900 0	950 0	1,000 0
14.	යතුරුපැදි හා ත්‍රිරෝදරථ සේවා ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	950 0
15.	L.P. ගෑස් විකිණීමට ගබඩාකර ඇති ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	700 0	950 0
16.	කෘෂි රසායන ද්‍රව්‍ය/රසායනික පොහොර තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	700 0	950 0
17.	කෘෂි රසායන ද්‍රව්‍ය/රසායනික විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	550 0	700 0
18.	මැණික් ගැරීම හෝ පතල් කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
19.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	650 0	800 0
20.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	600 0	700 0	950 0
21.	යකඩ ග්‍රිල් හා ගේට්ටු නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
22.	ලෝහ නිෂ්පාදන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	800 0
23.	යන්ත්‍රානුසාරයෙන් මිරිස්/තුනපහ ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	750 0
24.	මිරිස් තුනපහ, කුළුබඩු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	650 0
25.	යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම	550 0	600 0	700 0
26.	වඩුමඩුවක් පවත්වා ගෙන යාම	450 0	500 0	550 0
27.	ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක් සිසිල් බීම ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
28.	කොප්පරා නිපදවීම, සැකසීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0
29.	ගිනි පෙට්ටි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	950 0
30.	සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	600 0	700 0
31.	ධාන්‍ය හෝ මාංශ බෝග වර්ග හොන්ඩර 5 ට වැඩියෙන් ගබඩා කිරීම	550 0	700 0	950 0
32.	වීදුරු කපා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	700 0
33.	තීන්ත, වාර්නිෂ්, ඩිස්ටැම්පර් වර්ග ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
34.	විකිණීම සඳහා සිමෙන්ති ගබඩාකර තබන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	800 0
35.	ඇස්බැස්ටෝස් තහඩු වර්ග විකිණීම සඳහා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
36.	විකිණීම සඳහා හුණුගල් හෝ හුණු ගබඩාකර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
37.	බලවේග යන්ත්‍ර මගින් රෙදි විවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	800 0	1,000 0
38.	විකිණීම සඳහා තේ කුඩු තොග වශයෙන් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39.	රබර් කිරි එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	900 0
40.	රබර් ෂීට් නිෂ්පාදනය කිරීම, දුම් කාමරයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
41.	සජීවී සතුන් ඇතිකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0
42.	කුකුල් කොටුවක් පවත්වාගෙන යාම	550 0	600 0	700 0
43.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම/ආහාර වර්ග ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	700 0
44.	ගෘහ භාණ්ඩ නිපදවන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	700 0
45.	රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	550 0
46.	විනාකිරි නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	550 0
47.	පැණි/පැණි හකුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0
48.	ටයර්/ටියුබ් වෝල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	600 0
49.	සත්ව සායන ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0

ළ	ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන රු. ශ.	රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ.	රු. 1,500 ට වැඩි රු. ශ.
50.	කපාපු පොල් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
51.	සිසිල් බීම නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	600 0	700 0
52.	කුරුඳු බෙල් කිරීමේ හා කුරුඳු කපා සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	900 0	950 0	1,000 0
53.	ශබ්ද විකාශන යන්ත්‍ර කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0
54.	දුම්කොළ ආශ්‍රිත කර්මාන්තයක් පවත්වාගෙන යාම (බීඩි නිපදවීම/විකිණීම)	450 0	500 0	550 0
55.	උළු හෝ ගඩොල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	600 0
56.	ආහාර ද්‍රව්‍ය සිල්ලරට විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	550 0
57.	ආහාර ද්‍රව්‍ය ගබඩා කර තොග වශයෙන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
58.	ගෑස් ගබඩා කිරීම හා වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
59.	ගෘහ භාණ්ඩ ප්‍රදර්ශනය කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
60.	කුරුඳු සකස් කර ගෙන්දගම් දුම්ගැස්සීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
61.	විකිණීම සඳහා රබර් ෂීට් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
62.	පොල්තෙල් නිශ්කර්ෂණය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0
63.	සිමෙන්ති මිශ්‍ර ගඩොල් හෝ හියුම් පයිප්ප නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
64.	කොහු කෙඳි ගබඩා කිරීම, කොහු මෙට්ට නිපදවීම, ගබඩා කිරීම සහ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
65.	යන්ත්‍රානුසාරයෙන් බ්ලොක් ගල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
66.	ඇලුමිනියම් හා ප්ලාස්ටික් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
67.	බැටරි චාජ් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
68.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	600 0	650 0	750 0
69.	ස්වර්ණාභරණ නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	650 0	1,000 0
70.	අළුත් ටයර් හෝ රීබිල්ට් ටයර් හෝ පැරණි ටයර් ගබඩාකර, අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	950 0
71.	විදුලි උපකරණ ගබඩාකර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
72.	ඇඟලුම් කම්හලක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
73.	හුණු පෝරණුවක් පවත්වාගෙන යාම	400 0	500 0	600 0
74.	ලෝහමය සුන්බුන් හෝ බෝතල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
75.	මල් වීදුරු, ජනෙල් වීදුරු ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
76.	අමු තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	650 0
77.	යෝගට්, මුදවපු කිරි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
78.	මිනී පෙට්ටි නිපදවීම හා ගබඩා කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	950 0
79.	පොල්කටු අඟුරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0
80.	සත්ව ආහාර ගබඩා කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0
81.	කොහු ඉදල් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	600 0
82.	ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩා කර, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	800 0
83.	පොලිතින් නිෂ්පාදන ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	800 0
84.	මෙරට ද්‍රව්‍ය මිලට ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
85.	ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	700 0	900 0

150 වගන්තිය ප්‍රකාර ඇතැම් ව්‍යාපාර හෝ කර්මාන්ත පිළිබඳ බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය ප්‍රකාර, මුලටියන ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුලටියන ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ දැක්වෙන ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් මත වාර්ෂික බද්දක් පනවනු ලැබ ඇත. ඒ අනුව ගෙවිය යුතු වාර්ෂික බද්දේ ප්‍රමාණය, එම ව්‍යාපාරය හෝ කර්මාන්තය පවත්වාගෙනයන ස්ථානයේ වාර්ෂික වටිනාකම අනුව තීරණය කර ඇති අතර මෙකී වාර්ෂික බද්ද 2016 මාර්තු මස 31 දිනට පෙර මුලටියන ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු ය.

III උපලේඛනය

150 වගන්තියේ ප්‍රකාරව බදු

1.	රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	950 0
2.	ලිපි ද්‍රව්‍ය වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
3.	පාසල් උපකරණ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	600 0
4.	ඩිස්පෙන්සරියක් (ආයුර්වේද) පවත්වාගෙන යාම	500 0	550 0	600 0
5.	ඩිස්පෙන්සරියක් පවත්වාගෙන යාම (බටහිර)	700 0	950 0	1,000 0

	ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය	වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන රු. ශ.	රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ.	රු. 1,500 ට වැඩි රු. ශ.
6.	සාප්පු බඩු වෙළඳාම හා ප්ලාස්ටික් බඩු වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
7.	ගුවන්විදුලි, රූපවාහිනී හා විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	750 0
8.	අත් ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
9.	යතුරුපැදි අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
10.	යතුරුපැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	800 0
11.	පාපැදි අමතර කොටස් වෙළඳාම/අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	550 0	700 0
12.	යතුරුපැදි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
13.	මෝටර් රථ අමතර කොටස් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
14.	සුරතල් මසුන් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
15.	ඇඟළුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
16.	විදුලි උපකරණ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
17.	පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0
18.	ලොතරැයි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
19.	ස්වර්ණාභරණ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	650 0	1,000 0
20.	ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	800 0
21.	ලුණු/කොහු/ඉදල්, පාපිසි භාණ්ඩ නිපදවීමේ/විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
22.	පිත්තල උපකරණ වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	700 0
23.	නිමි ඇඳුම් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	550 0	750 0
24.	මනාලියන් හැඩගන්වන ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
25.	ටයර් වෙළෙඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	900 0
26.	රෙකෝඩ්බාර් ආයතනයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
27.	වීඩියෝ/සීඩී/වීසීඩී/වෙළඳාම හා පටිගත කිරීම/කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
28.	ඡායා පිටපත්ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	550 0
29.	දුරකථන ඇමතුම් ගැනීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (ටෙලෙක්ස්/ෆැක්ස් සහිත)	500 0	700 0	800 0
30.	උත්සව භාණ්ඩ කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම (මඩු, පුටු, පිඟන්)	600 0	700 0	950 0
31.	මැණික් කැපීමේ හා ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	700 0	800 0
32.	පාවහන් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	550 0
33.	පාවහන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	550 0	700 0
34.	බීර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	700 0	950 0	1,000 0
35.	වීදුරු භාණ්ඩ/පිඟන් භාණ්ඩ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	600 0
36.	පරිගණක සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	700 0
37.	විදුලි සංදේශ උපකරණ අලෙවිය/ගබඩා කිරීම සහ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	950 0
38.	මහන මැෂින් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	650 0	750 0
39.	පුවත්පත් හා සඟරා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0
40.	ජ්‍යොතිෂ කාර්යාලයක් පවත්වාගෙන යාම	450 0	500 0	600 0
41.	ලුණු ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	550 0	700 0	950 0
42.	නාමපුවරු හා දැන්වීම් පුවරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
43.	ඇන්ටනා නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
44.	ඇළුමිනියම් හෝ ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
45.	සමුපකාර ප්‍රාදේශීකයක් පවත්වාගෙන යාම	400 0	500 0	550 0
46.	පරිගණක පහසුකම් සහිත මංගල සේවා ආයතනක් පවත්වාගෙන යාම	450 0	550 0	600 0
47.	ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ හා උපකරණ සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	950 0
48.	ත්‍රී විලර් අමතර කොටස් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	700 0
49.	ත්‍රී විලර් අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	450 0	550 0	650 0
50.	පැල තවාන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	500 0	550 0
51.	සම් භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	550 0
52.	මැටි භාණ්ඩ වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	550 0
53.	කිරි හලක් පවත්වාගෙන යාම	450 0	500 0	550 0
54.	ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම	600 0	650 0	750 0
55.	දන්ත කාර්මික ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	550 0
56.	අමු තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	550 0	750 0
57.	ආගමික ප්‍රතිමා හා වෙනත් විසිතුරු නිෂ්පාදන අලෙවි කරන ස්ථානයක් පවත්වාගෙන යාම	400 0	450 0	500 0

	ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ ස්වභාවය	*වාර්ෂික වටිනාකම රු. 750 ට වැඩි නොවන රු. ශ.*	*රු. 751 සිට රු. 1,500 දක්වා රු. ශ.*	*රු. 1,500 ට වැඩි රු. ශ.*
58.	අයිස්ක්‍රීම් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	800 0
59.	කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
60.	දුරකථන උපාංග අළුත්වැඩියා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	800 0
61.	සුදු යකඩ ආශ්‍රිත වැඩපලක් පවත්වාගෙන යාම	500 0	600 0	700 0
62.	ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	800 0
63.	ඇස් කණ්ණාඩි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	600 0	700 0	800 0

10-292/1

මුලටියන ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2016 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වගන්තිය ප්‍රකාරව මුලටියන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් අය නොකරන ප්‍රදේශයක් තුළ පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ද ඉඩම් වලින් පහත උපලේඛනයෙහි දැක්වෙන අනුප්‍රමාණයන්ගෙන් යුත් අක්කර බද්දක් 2016 වර්ෂයට පනවා 2016 මාර්තු 31, ජුනි මස 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් මස 31 වැනි දින වලින් අවසන් වන කාර්තු 4 කින් අය කර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.09.04 දින අංක 394 දරන තීරණය අනුව තීරණය කල බවත්, එකී කාර්තු අවසන් වීමට ප්‍රථම බදු ගෙවිය යුතු බවත් දැනුම් දෙමි.

සී. ඒ. එන්. ජයවර්ධන
ලේකම්,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2015 සැප්තැම්බර් මස 04 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

1.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05 ට අඩු නමුත් හෙක්ටයාර් 1 ට නොඅඩු අවස්ථාවක හෙක්ටයාරකට	රු. 50 බැගින්
2.	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩි වන අවස්ථාවක එක් හෙක්ටයාරයකට	රු. 10 බැගින්

10-292/2

මුලටියන ප්‍රාදේශීය සභාව

වාහන හා සතුන් පිළිබඳ බදු - 2016 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අනු ප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්ද 2016 වර්ෂය සඳහා අය කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.09.04 දින අංක 393 දරන තීරණය අනුව තීරණය කල බව එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සී. ඒ. එන්. ජයවර්ධන
ලේකම්,
මුලටියන ප්‍රාදේශීය සභාව.

2015 සැප්තැම්බර් මස 04 වැනි දින,
මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

	උපලේඛනය	**රු. ශත**
1.	මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වහනයක් සඳහා	25 0
2.	සෑම බයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා-	
	(අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0

